කාරෙයිතිවු ප්‍රාදේශීය සභාව
අම්පාර දිස්ත්‍රික්කය
---------------------

1 මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 21 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 ජුනි 06 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 සැප්තැම්බර් 21 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට කාරෙයිතිවු ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලවීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංශ 2 අනුව ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශ ඉදිරිපත් කළ යුතු වුවද, එවැනි මුදල් ප්‍රවාහ ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණ විය.

(අ) ලෙජරය අනුව සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ගෙවන ලද සැපයුම් සේවා අවශ්‍යාක රු. 5,354,548 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල රු. 5,340,693 ක් ලෙස පෙන්වා තිබීමෙන් ගෙවන ලද සැපැයුම් සේවා අවශ්‍යක රු. 13,894 කින් අඩුවෙන් පෙන්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී රු. 20,180 ක මුදලට මිලදී ගන්නා ලද ජල මෝටරය මූල්‍ය ප්‍රකාශවල පෙන්වා නොතිබුණි.

1.3.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

පහත නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) රඳවා ගැනීම් බදු රු. 271,460 ක් දේශීය ආදායම් දේපාර්තමෙන්තුව ප්‍රේශණය නොකර වර්ෂ 06 ක් පමණ කාලයක් ගිණුම්වල දිගටම පෙන්වා තිබුණි.

(ආ) ජාතිය ගොඩනැගීමේ බද්ද රු. 10,003 ක් දේශිය ආදායම් දෙපාර්තමෙන්තුවට ප්‍රේශණය නොකර වර්ෂ 05 ක කාලයක් තැන්පත් ගිණුමේ දිගටම පෙන්වා තිබුණි.

(ඇ) 2008 වර්ෂයේ සිට ලැබියයුතු මුදලක් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දිගටම පෙන්වා තිබූ මහජන පොල බදු ආදායම් රු. 15,000 ක මුදල අයකර ගැනීමට හෝ පොත්වලින් කපා හැරීමට හෝ විගණන දිනය වන 2015 ජුනි 19 දක්වා කටයුතු කර නොතිබුණි.

(ඈ) ස්ථාන මාරු වී ගිය නිලධාරින් 04 දෙනෙකුගෙන් අයවියයුතු රු. 37,697 ක ණය ශේෂය වර්ෂ 09 කට වඩා වැඩි කාලයක සිට හිඟව තිබුණද අදාල ආයතන වලින් ගෙන්වා ගැනීමට 2015 ජුනි 19 දක්වා කටයුතු කර නොතිබුණි.

(ඉ) 1992 වර්ෂයේ සිට 2013 වර්ෂයෙ අවසානය දක්වා හිඟව තිබූ මස්කඩ බදු කුලිය රු. 736,640 ක මුදල ගැනීමට හෝ පොත්වලින් කපා හැරීමට විගණන දිනය වන 2015 ජුනි 19 දින දක්වා කටයුතු කර නොතිබුණි.

1.3.5 විගණන සඳහා සාක්ෂි නොවීම
---------------------------------
මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා තිබූ එක්එක් විෂයන් ඉදිරියෙන් පෙන්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| විෂයන් | වටිනාකම් | ඉදිරිපත් නොකළ සාක්ෂි |
| --- | --- | --- |
| | රු. | |
| ඉඩම් හා ගොඩනැගිලි | 95,892,768 | ස්ථාවර වත්කම් ලේඛන සහ සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| උපකරණ හා යන්ත්‍රෝපකරණ | 2,613,470 | |
| පුස්තකාල පොත් | 1,471,105 | |

2. මූල්‍ය සමාලෝචනය
----------------------
2.1 මූල්‍ය ප්‍රතිඵලය
----------------
ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ඉක්මවූ පුනරාවර්තන වියදම් රු. 4,383,845 ක් වූ අතර, ඊට අනුරූපීම ඉකුත් වර්ෂයේ ආදායම් ඉක්මවූ පුනරාවර්තන වියදම් රු. 3,795,378 ක්වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 588,467 ක පිරිහීමක් පෙන්නුම් කෙරිණ.

2.2 ආදායම් පරිපාලනය
----------------------
2.2.1 දැන්වීම් පුවරු සඳහා ගාස්තු අයකිරීම
---------------------------------------
1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 126 වගන්තිය අනුව සභාව විසින් ආදායම් අයකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවීමේ ප්‍රමාද වීම නිසා සභා බල ප්‍රදේශයේ පුද්ගලික ආයතන වලින් තමන්ගේ වෙළඳ භාණ්ඩ පිළිබඳ ප්‍රචාරය කිරීම සඳහා දැන්වීම් පුවරු 04 ක් සහ සන්නිවේදන ආයතනවලින් ස්ථාපතකර තිබූ සන්නිවේදන කුළුණ 02 ක් සඳහා සමාලෝචිත වර්ෂය සඳහා අයකරගතයුතු රු. 175,000 ක ආදායමක් සභාවට අහිමිවී තිබුණි.

2.2.2 වරිපනම් හා බදු
----------------
ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි කඩ කාමර 54 කින් සහ පවුල් 5175 ක් වාසය කරන ඉඩම් හා ඉදිකරන ලද නිවාස හා ගොඩනැගිලි වෙනුවෙන් 2003 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා වරිපනම් බදු ගණනයකර අයකර ගැනීම සඳහා සභාව ක්‍රියාකාරි නොකිරීමෙන් වාර්ෂිකව රු. 180,000 ක ආදායමක් අහිමිවී තිබුණි.

2.2.3 උසාවි දඩ මුදල්
----------------
විවිධ ආඥා පනත් යටතේ මහේස්ත්‍රාත් අධිකරණයෙන් 2014 දෙසැම්බර් 31 දිනට අයවියයුතු රු. 654,965 ක් උසාවි දඩ මුදල් පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් මෙතෙක් ලබා ගෙන නොතිබුණි.

2.2.4 මුද්දර ගාස්තු

--------------

2014 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු මුද්දර ගාස්තු රු. 2,269,077 ක් රෙජිස්ටාර් ජනරාල් වරයාගෙන් ලබාගෙන නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කළමණාකරණ දුර්වලතා

----------------------------

(අ) නිෂ්චිත විශේෂ පළාත් සංවර්ධන (SDG) ආධාර ක්‍රමය යටත් 2012 නොවැම්බර් 22 දින මිලදී ගෙන තිබු රු. 754,200 ක් වටිනා ප්ලාස්ටික් කුඩු කරන යන්ත්‍රය අදාල කාර්ය සඳහා යොදවා නොගෙන 2015 ජුනි 19 දින දක්වා ගබඩාවේ තබා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී වීථි පහන් 759 ක් නඩත්තු කිරීම සඳහා රු. 138,380 ක මුදලට විදුලි බුබුළු සහ උපකරණ මිලදී ගෙන තිබුණි. මෙම විදුලි උපකරණ මිලදී ගැනීම, තොග ලේඛන පවත්වා ගැනීම, භාණ්ඩ නිකුත්කිරීම සහ ගෙවීම් වවුචර් පිළියෙල කිරීම සියළුම කටයුතු එක් නිලධාරියෙකු විසින් පමණක් සිදුකර තිබුණි.

3.2 කොන්ත්‍රාත් පරිපාලනය

--------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී ප්‍රාදේශීය සභා සවිමත් කිරීමේ වැඩ සටහන යටතේ රු. 4,000,000 ක මුදලක් ලබාදී තිබුණද ඉන් රු. 1,396,000 ක් පමණක් ළමා උද්‍යානය සහ මොටර් වාහන අළුත්වැඩියාව සඳහා යොදවා ගෙන ඉතිරි මුදල අදාල කාර්ය සඳහා නොයොදවා තිබුණි. තවද, ඉතිරි මුදල් පළාත් පාලන සහා අමාත්‍යාංශයේ PL/3/1/47 අංක හා 2015 අප්‍රේල් මස ලිපිය අදාල 2015 මැයි 15 දිනට ප්‍රථම අමාත්‍යාංශය වෙත ගෙවියයුතු බව සඳහන් කර තිබුණද, විගණන දිනය වන 2015 ජුන් 19 දිනය දක්වා ආපසු යවා නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී සභා බල ප්‍රදේශියේ තිබෙන මාර්ග 03 ක් බොරලු පස් යොදා සකස්කිරීම සඳහා රු. 562,500 ක මුදලට ප්‍රජා පාදක සමිතියකට කොන්ත්‍රාත් ලබාදී තිබුණි.
මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

- (i) මෙම මාර්ග ප්‍රතිසංස්කරණය පිළිබඳ කාර්මික නිලධාරි සමඟ කරන ලද ක්ෂෙත්‍ර පරික්ෂයේදී 39.45 cm ප්‍රමාණයේ මාර්ගයේ බොරළු පස් යොදා නොතිබුවද එම කාර්යය නිසි ලෙස ඉටු කර ඇති බවට නිර්දේශකර රු. 49,402 ක් ගෙවීම් කර තිබුණි.
- (ii) බාල තත්වයේ බොරලු පස් යොදා තිබීම නිසා මෙම මාර්ගය මහජන ප්‍රයෝජන ගැනීමේදී ගැටලු සහිත තත්වයක් උදාවී ඇත.

(ඇ) පුරනැගුම වැඩ සටහන් යටතේ ඉදිකරන ලද නව සභා ගොඩනැගිල්ල සඳහා ජල මොටර්යන් සවිකිරීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

- (i) මෙම ගොඩනැගිල්ල සඳහා ජල මෝටරයක් සවිකිරීම සඳහා රු. 34,000 ක් ඇස්තමෙන්තු කර තිබුණද අදාල ගොඩනැගිලි ක්‍රොන්ත්‍රාත්කරු ලවා සවිකර ගැනීමට ක්‍රියා නොකිරීම නිසා සභා අරමුදලෙන් යොදවා රු. 20,180 ක් වැයකර ජල මොටරයක් මිලදී ගෙන තිබුණි.
- (ii) උක්ත ජල මෝටරය 2014 ඔක්තොබර් 24 වන දින මිලදී ගෙන තිබුණද ඉන්පසු 2014 නොවැම්බර් 27 දින එම ජල මෝටරය මිලදී ගැනීමට අදාල තීරණය සභාව විසින් ගෙන තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී ඝණ අපද්‍රව්‍ය කළමණාකරණ වැඩ සටහන සඳහා යොදවා ගන්නා වාහන වෙනුවෙන් රු. 740,520 ක මුදලකට ටයර් 18 ක මිලදි ගැනීම් සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) මිල ගණන කැඳවන අවස්ථාවේදී අදාල ටයරයේ වෙළඳ නාමය සහ භාණ්ඩ සංකේතය සඳහන් නොකර මිළ ගණන් කැඳවා තිබුණි.

(ii) මිළදීගත් දිනයේදී අදාල CEAT වර්ෂයේ 8.25 X 20 ප්‍රමාණයේ ටයරයේ වෙළඳ පොල මිල වලට වඩා වැඩි මිලයකට මිලදී ගැනීම නිසා සභාව රු. 125,625 ක මුදලක් වැඩියෙන් ගෙවා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී විපුලානන්ද මහජන පුස්තකාලය වෙත PSDG මූල්‍ය ප්‍රතිපාදනය යටතේ රු. 300,000 ක මුදලකට පොත්පත් මිළදී ගෙන තිබුණි මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) මෙම මිලදී ගැනීම් සම්බන්ධයෙන් ලබාගත් මිළ ගණන් ප්‍රසම්පාදන කමිටු රැස්වීම් ආරම්භකරන තෙත් මිළගණන් පෙට්ටියට නොදමා නිලධාරියා සතුව තබාගෙන තිබුණි.

(ii) මෙම පොත් මිලදි ගැනීම සඳහා ප්‍රසම්පාදන කමිටුවේ තීරණය 2014 මැයි 27 වන දින ගෙන තිබුණද මිලදී ගැනීම සඳහා තෝරාගෙන තිබුණු සැපයුම්කරුගේ මිළ ගණන 2014 මැයි 28 වන දිනයේදී සභාවට ලැබී තිබුනු බව ලිපි කවරයේ සඳහන් තැපැල් කාර්යාලයේ මුද්‍රාවෙන් පැහාදිලිවිය.

(iii) අවශ්‍ය පොත්වල ලැයිස්තුවක් පිළියෙළ නොකර පුස්ථකාලාධිපතිගේ අභිමතය පරිදි මිලදී ගෙන තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේදී PSDG මූල්‍ය ප්‍රතිපාදනය යටතේ කාරෙතීවු අංක 01 කොට්ඨාශයේ මාදවි මාර්ග කොන්ක්‍රීට් කිරීම සඳහා රු. 870,464 ක් මුදලක් වැයකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ඉහත මාර්ගයේ පළල මීටර් 3 ක් තිබියේදී මාර්ගය සකස්කිරීම සඳහා මොටර් ග්‍රේඩර් යන්ත්‍රකුලි වශයෙන් රු. 16,000 ක් ගෙවා තිබුණි. කෙසේවුවද විගණනයන් ඉදිරිපත් කරන ලද ලියවිලි අනුව මොටර් ග්‍රේඩරයට වෙනුවට JCB යන්ත්‍ර යොදවාගෙන තිබුණි.

(ii) මාර්ග ඉදිකිරීම්වලට අදාල විස්තර සමඟ නාම පුවරුව සවිකිරීම සඳහා රු. 10,000 ක් ගෙවීම්කර තිබුණද 2015 ජුනි 19 දින ස්ථානයේ පරික්ෂණයේදී නාම පුවරුව මාර්ගයේ සවිකර නොතිබුණි.

(iv) තාක්ෂණ නිලධාරි විසින් ප්‍රමාණපත්‍රයේ අනුව කොන්ක්‍රීට් සඳහා මි.මි. 6 ප්‍රමාණයේ 783 Kg කම්බි යොදාගතයුතුබව සඳහන්කර තිබුණද ගෙවීම් මිණුම් පත්‍රයේ 722 Kg කම්බි පමණක් යොදවා ගෙවීම් සිදුකර තිබුණි. තාක්ෂණ නිලධාරිගේ මිණුම් වාර්තාවට අනුකූල නොවී 61 Kg කම්බි යොදා නොතිබීම තිබීම නිසා ඉදිකරන ලද මාර්ගයේ පැවැත්වට බාධා වී ඇත.

4 ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

----------------------------------------

4.1 අභ්‍යන්තර විගණනය

------------------------

එක් එක් පළාත් පාලන ආයතන තමන්ගේ හැකියාව අනුව අභ්‍යන්තර විගණන අංශයක් හා පිහිටුවා ගත යුතු බව පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ 2005 නොවැම්බර් 08 වන දින අංක 03 දරණ පළාත් පාලන ප්‍රතිසංස්කරණය පිළිබඳ චක්‍රලේඛයේ 8 වන ඡේදයෙන් පෙන්වාදී තිබු පරිදි සභාවේ අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා නොතිබුණි.

5 පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) ස්ථාවර වත්කම් පාලනය

(ඈ) අත්තිකාරම් අයවීම

(ඉ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය

(ඊ) කොන්ත්‍රාත් පරිපාලන